# සමුපකාර සේවක කොමිෂන් සභාව (දකුණු පළාත)
கூட்டுறவு ஊழியர் ஆணைக்குழு (தென் மாகாணம்)
# Co-operative Employees Commission (Southern Province)

සැලසුම් ලේකම් කාර්යාලයීය ගොඩනැගිල්ල (1 වන මහල), එස්. එච්. දහනායක මාවත, ගාල්ල.
திட்டமிடல் செயலாளர் அலுவலக் கட்டிடம் (1ம் மாடி), எஸ்.எச், தஹநாயக மாவத்தை, காலி.
**Planning Secretariat Building (1 st Floor), S. H. Dahanayaka Mawatha, Galle.**


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல<br>My No. | SP/CEC/1/O/5 | ඔබේ අංකය<br>உனது இல<br>Your No. | | දිනය<br>திகதி<br>Date | 2023.06.01 |

චක්‍රලේඛ අංක 2/2023

දකුණු පළාතේ සියලුම සමුපකාර සමිති සභාපතිවරුන් වෙත,

<u>**සමුපකාර සේවකයින් මැතිවරණ සඳහා අපේක්ෂකයන් ලෙස ඉදිරිපත් වීමේදී නිවාඩු ලබා දීමසහ පළාත් පාලන ආයතන/පළාත් සභාවක සභිකයන් ලෙස තේරී පත්වූ සමුපකාර සේවකයින් සඳහා නිවාඩු ලබාදීම.**</u>

උක්ත කරුණ සම්බන්ධයෙන් සමුපකාර සමිති විසින් හා සේවකයින් විසින් කරන ලද ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා බලා පහත සඳහන් පොදු විධිවිධාන සහිත චක්‍ර ලේඛය නිකුත් කරනු ලැබේ.

02\. i. යම් සමුපකාර සේවකයකු පළාත් සභාවට හෝ ප්‍රාදේශීය සභාවකට අපේක්ෂකයකු ලෙස ඉදිරිපත් වන්නේ නම් එකී මැතිවරණය සඳහා නාම යෝජනා භාරදුන් දින සිට මැතිවරණය පැවැත්වෙන දිනය දක්වා වූ කාල සීමාව සඳහා වැටුප් රහිත නිවාඩු ලබා දිය යුතුය.

ii. පළාත් පාලන ආයතනයක මන්ත්‍රී ධූරයක් සඳහා තේරී පත්වී ඇති සමුපකාර සේවකයින්ට එම සභා රැස්වීම් වලට සහභාගී වීම සඳහා සමුපකාර සේවයේ හදිසි අවශ්‍යතාවන්ට යටත්ව,මසකට දින 05ක් දක්වා සම්පූර්ණ වැටුප් සහිත නිවාඩු ලබාදිය යුතුය.පළාත් පාලන ආයතනයක සභාපති තනතුර සඳහා තේරී පත්වන සමුපකාර සේවකයකුට මසකට දින 07ක් දක්වා සමුපකාර සේවයේ හදිසි අවශ්‍යතාවයන්ට යටත්ව වැටුප් සහිත නිවාඩු ලබා දිය යුතුය.

iii. යම් සමුපකාර සේවකයෙකු පළාත් සභාවක සභිකයෙකු ලෙස තෝරා පත්කර ගනු ලැබුවහොත් ඔහු එම පළාත් සභාවේ සභිකයෙකු ලෙස සිටිනතාක් කල් එහි සේවය කිරීමට හැකිවන පරිදි වැටුප් රහිත නිවාඩු මත සේවයෙන් නිදහස් කල යුතුය.මෙසේ නිදහස් කරනු ලැබූ විට එම තනතුර පුරප්පාඩු තනතුරක් ලෙස නොසැලකිය යුතුවන අතර, තනතුරේ වැඩ ආවරණය කිරීම සඳහා සුදුසු විකල්ප වැඩ පිළිවෙලක් සමිතිය විසින් යෙදිය යුතුය.

03\. තවද,02(iii) හි සඳහන් එම නිවාඩුව විශේෂ නිවාඩුවක් බැවින්,එම කාලය සේවකයාගේ සේවා කාලය ගණනය කිරීමේ දී බාධාවක් කර නොගත යුතුය.

04\. එසේම, 02(iii) හි සඳහන් එකී වැටුප් රහිත නිවාඩු සේවකයාගේ ජ්‍යෙෂ්ඨත්වය සලකා බැලීමේදී, උසස්වීම් ලබා දීමේදී සහ වැටුප් වර්ධක ලබා දීමේදී සැලකිල්ලට නොගතයුතුය.

05\. මෙම චක්‍ර ලේඛයේ විධිවිධාන 2023.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි කොමිෂන් සභාවේ අනුමැතිය මත නිකුත් කරන ලදී.

ජයන්ත ජී. ලියනගේ.
ලේකම්,
සමුපකාර සේවක කොමිෂන් සභාව,
දකුණු පළාත.

ජයන්ත ජී. ලියනගේ
ලේකම් (වැ.බ.)
සමුපකාර සේවක කොමිෂන් සභාව
දකුණු පළාත

පිටපත -1. ලේකම්, කෘෂිකර්ම,ගොවිජන සංවර්ධන ... සමුපකාර අමාත්‍යාංශය — දැ.ගැ.ස.

2\. සමුපකාර සංවර්ධන කොමසාරිස්/රෙජිස්ට්‍රාර්, දකුණු පළාත — කරු.සමු.සං.ප්‍රා.නි. හරහා අදාල සමිති දැනුවත් කිරිම සඳහා

3\. දකුණු පළාත් සමුපකාර සේවක කොමිෂන් සභා චක්‍රලේඛ ගොනුවට


ලේකම් / செயலாளர் / Secretary – 091-2232794
පරිපාලන නිලධාරි / நிர்வாக அதிகாரி / Administrative Officer – 091-2234279
කාර්යාලය/ෆැක්ස් / அலுவலகம்/பெக்ஸ் / Office/ Fax – 091-2234383
වෙබ් අඩවිය / இணையத்தளம் / Web Site – www.cec.sp.gov.lk
විද්‍යුත් තැපැල / மின்னஞ்சல் / E-mail – empcommicoopsp@sltnet.lk